# සමෘද්ධි බැංකු සංගම් හි

## පොදු ලෙජරය හා ශේෂ පරික්ෂණය සදහා නිශ්චිත කේත අංකන ක්‍රමයක් හඳුන්වාදිම මගින් සම්මත ආකෘතියකට ගෙනඒම.

**බැංකු මුල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 19 ට හතර වන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
   ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ..............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, ........................................
   කොළඹ 10.
5. මුලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ........................................
6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ........................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
8. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. සාමාන්‍යාධිකාරි සහ
    සියළුම අධ්‍යක්ෂවරු,
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී.
    ජායා මාවත,

**බැංකු මුල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.10.17**

දුරකථන අංකය :- 0112 – 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

## බැංකු මූලා කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන
## මෙහෙයුම් උපදෙස් අංක 19 ට හතර වන එකතුව

### සමෘද්ධි මහ සංගම්හි පොදු ලෙජරය හා ශේෂ පරීක්ෂණ සඳහා නිශ්චිත කේත අංකන ක්‍රමයක් හඳුන්වා දීම තුලින් පොදු ආකෘතියකට ගෙන ඒම.

හැදින්වීම-: සමෘද්ධි බැංකු සංගම් සඳහා මේ වන විට විධිමත් කේත අංක ක්‍රමයක් පොදු ලෙජරය සඳහා හඳුන්වා දී ඇත.

ආරම්භයේ සිට සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් හී ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලය මගින් ලබාදීම හෝ මහ සංගම්/ බැංකු සංගම් මගින් දැරීම සඳහා අනුමැතිය ලබාදෙනු ඇත.

1.1 ආරම්භයේ සිට සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් ඉදිකිරීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ලබාදුන් ප්‍රතිපාදන හෝ බැංකු සංගම්/ මහ සංගම් වෙතින් දරණු ලැබූ ඉදිකිරීම්/ අළුත්වැඩිය සඳහා වූ වියදම් බැංකු සංගම්/ මහ සංගම් හී වත්කම් ගිණුම් ලෙස මෙතෙක් සටහන් වී නොමැත.

1.2 ප්‍රධාන කාර්යාලය මගින් ලබාදුන් ප්‍රතිපාදන අධිකාරියේ වත්කමක් ලෙසට අධිකාරියේ අවසාන ගිණුම් හී පෙන්නුම් කළද ඒ ඒ බැංකු සංගම්/ මහ සංගම් තුලින් දරනු ලැබූ අරමුදල් ඉදිරියේ දී විධිමත් පරිදි වත්කම් ගිණුම් හී සටහන් කිරීමට අපේක්ෂා කෙරේ.

2.0 ඒ අනුව පහත සඳහන් පරිදි දක්වා ඇති කේත අංක යටතේ සමෘද්ධි බැංකු සංගම් පොදු ලෙජරයේ වත්කම් ගිණුම් විවෘත කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් වෙත අනුමැතිය ලබාදේ. බැංකු සංගම් සඳහා පමණක් දැනට මෙම කේත අංක යටතේ ඉදිකිරීම් වියදම් පමණක් තබාගැනීමට අනුමැතිය ලබාදේ.

2.1 මහ සංගම් සම්බන්ධයෙන් කේත අංක හඳුන්වාදීම පිළිබඳ මෙහෙයුම් උපදෙස් අංක 19 ට 3 වන එකතුව තුළින් උපදෙස් ලබා දී ඇති අතර, එහි දක්වා ඇති කේත අංක යටතේ මහ සංගම් හී ඉදිකිරීම් සම්බන්ධ ගිණුම් සටහන් තැබිය හැකි වේ.

2.2 ඒ අනුව, සමෘද්ධි බැංකු සංගම් හී පොදු ලෙජරයේ පහත වත්කම් ගිණුම විවෘත කළයුතුව ඇත.

- සමෘද්ධි බැංකු සංගම් ඉඩම්, ගොඩනැගිලි හා ආශ්‍රිත ඉදිකිරීම් (කේත අංක 4044- වත්කම් ගිණුම)

මෙම ගිණුම සඳහා ගිණුම්ගත කළ හැක්කේ පහත සඳහන් කාර්යයන් සඳහා දරණ ලද වියදම් පමණි.

- ➢ විදුලිය සඳහා ඇතුළත වයරින් කිරීම.
- ➢ වැසිකිළි ඉදිකිරීම් හා ඊට අදාල කටයුතු.
- ➢ අමතර කොටස් එකතු කිරීම්. (ගබඩා කාමර, කළාප කාර්යාල හා ප්‍රමාණය වැඩි කිරීම් ඇතුළු වෙනත්)
- ➢ ගොඩනැගිලි බිම සැකසීම (Tile කිරීම, සිමෙන්ති දැමීම ඇතුළු කටයුතු)
- ➢ ගොඩනැගිල්ල වටා තාප්පය හෝ වැට ඉදිකිරීම..

2.2 ඉහත කේත අංකයන් යටතේ සටහන් තැබිය හැක්කේ බැංකු සංගමය මගින් සෘජුවම ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය මත වියදම් දරණු ලබන අවස්ථාවේ දී පමණි.

2.3 ඒ අනුව මේ වන විට වැය ගිණුම් යටතේ 2013 වර්ෂයට පමණක් අදාලව ඉදිකිරීම්/ අළුත්වැඩියා යටතේ සටහන් තබා ඇති වියදම් ඉහත කේත අංකය යටතේ වූ වත්කම් ගිණුම් තුලට මාරු කිරීම සඳහා මින් අනුමැතිය ලබාදෙමු.

2.4 ඒ අනුව, වැය ගිණුම් හී සටහන් තබා ඇති 2.1 හි සඳහන් අයිතමයන් ඉහත කේත අංක 4044 මගින් හඳුන්වා දී ඇති නව ගිණුමට මාරු කළ යුතුය.

2.5 මෙම ගොඩනැගිලි හා ඉදිකිරීම් වත්කම් වියදම් දැරූ වර්ෂයේ සිට ඉදිරියට වර්ෂ 10 ක් තුළ ක්ෂයවීම් කළ යුතුය. ඒ සඳහා පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

- (වැය) ගිණුම - සමෘද්ධි බැංකු සංගම් ඉඩම්, ගොඩනැගිලි හා ආශ්‍රිත ඉදිකිරීම් ක්ෂය ගිණුම - හර (නව ගිණුමකි. කේත අංක 2138) යටතේ පොදු ලෙජරයේ මෙම ගිණුම විවෘත කළ යුතු වේ.
- සමෘද්ධි බැංකු සංගම් ඉඩම්, ගොඩනැගිලි හා ආශ්‍රිත ඉදිකිරීම් ක්ෂය වෙන්කිරීමේ සංචිත ගිණුම - බැර (නව ගිණුමකි. කේත අංක 4045) යටතේ පොදු ලෙජරයේ මෙම ගිණුම විවෘත කළ යුතු වේ.

2.6 මෙම ක්ෂය වෙන් කිරීමේ කාර්යයන් එම කාර්ය සිදුකරන ආරම්භක වර්ෂයේ සිට ඉදිරියට සිදුකළ යුතුය. මෙම ගොඩනැගිලි හා ගිණුමට අදාලව පහත පරිදි ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

| දිනය | ඉදිකිරීම් අළුත්වැඩියා විස්තරය | දරන ලද වියදම | ක්ෂය වෙන්කිරීම් ආරම්භක වර්ෂය | ක්ෂය වෙන්කිරීම් අවසන් කරන වර්ෂය | වාර්ෂික ක්ෂය ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

මෙම ලේඛනය පදනම් කරගෙන වාර්ෂිකව ක්ෂය වෙන්කිරීම් ගණනය කර ඉහත ගිණුම් වලට මාරු කළ යුතුය.වැය ගිණුම -ගොඩනැගිලි හා ඉදිකිරීම් ක්ෂය ගිණුම, වර්ෂ අවසානයේ ගිණුම් පියවීමේ දී ලාභාලාභ ගැලපුම් ගිණුමට මාරු කළ යුතුය.

ඉහත ක්ෂය වෙන් කිරීම් අනෙකුත් ක්ෂය වෙන්කිරීම් සිදුකරන ආකාරයටම වාර්ෂිකව සිදුකිරීමට බැංකු සංගම් ක්‍රියා කළ යුතුය.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂජනරාල්.

කේ.කේ.එල්.චන්ද්‍රතිලක
නියෝජ්‍ය අධ්‍යක්ෂ බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්.